රිනිව් 2024

**න්‍යාය පත්‍රය**

- **ප්‍රධාන/පූර්ණ සැසි**
- **වැඩමුළු**
- **වට මේස සාකච්ඡා**
- **අවකාශ**
- **සාද සහ විනෝදය!**

රිනිව් 2024 සංකල්පය බිහි වන්නේ ලිංගික ශ්‍රමිකයන් - පූර්ණ රැස්වීම්, වැඩමුළු සහ ක්‍රියාකාරකම්, මෙන්ම දෘශ්‍ය අනන්‍යතාවය සහ අවකාශයන් යන සියලු සැලසුම්වල වල කේන්ද්‍රස්ථානය ලෙසයි. දිගුකාලීන CREA මිතුරෙකු සහ ග්‍රැෆික් නිර්මාණ ශිල්පිනියක වන ෂෙර්නා ඩාස්ටූර්, ලිංගික ශ්‍රමිකයන්ගේ හඬ සහ මුහුණුත සමුළුව සඳහා නිර්මාණය කළ සියලුම ද්‍රව්‍යවල ඉදිරිපස සහ මැදින් තැබුවාය. අපගේ රැස්වීම විවිධ භාෂා කතා කරන අය එකට එකතු වන නිසා, ඇය කලාපයේ භාෂා කිහිපයක් ඇගේ නිර්මාණයට ගෙතුවාය: අප වටා තිබෙන ලිංගික ශ්‍රමිකයන්ගේ අදහස් සහ වැකි ෂර්මිලා භූෂන්ගේ කණ්ඩායම විසින් භාෂා හයකට පරිවර්තනය කර ඇත (බංග්ලා, හින්දි, නේපාල, දෙමළ, සිංහල සහ උර්දු).. තවත් CREA මිතුරෙකු වන යශ් චන්ද්‍රා, හැකි සෑම අවස්ථාවකදීම ප්ලාස්ටික් සහ කෘතිම ද්‍රව්‍ය වෙනුවට ස්වභාවික රෙදි සහ ද්‍රව්‍ය තෝරා ගනිමින් ඉඩ සැලසුම් කිරීම සඳහා ඔහුගේ ප්‍රවේශයට තිරසාර බව එක් කළේය. ස්තූතියි, කැප වූ ස්ත්‍රීවාදීන්ට!

## ප්‍රධාන/පූර්ණ සැසි (ප්ලීනරි)

**ප්‍රධාන/පූර්ණ සැසියක් යනු කුමක්ද?** සමුළුවක (හෝ සම්මන්ත්‍රණයක හෝ රැස්වීමක) පූර්ණ රැස්වීමක් යනු සියලුම සහභාගිවන්නන් සහභාගී වන සැසියක් වේ. මෙහිදී තේමා පුළුල් පරාසයක පවතින අතර, පැමිණ සිටින සෑම කෙනෙකුටම අර්ථවත් සහ සිත්ගන්නාසුළු කරවීමේ අභිප්‍රාය ඇත.

<u>මැයි 29: උද්ඝාටන පූර්ණ සැසිය (පෙ.ව. 11.30 - ප.ව. 1.00)</u>

**<u>මුල්ම නර්තන ප්‍රසංගය</u>**
නේපාලයේ ජග්රිටි මහිලා මහා සන්ග් (JMMS), සාමාජිකයින් විසිනි. 2006 දී පිහිටුවන ලද්, JMMS, යනු නේපාලයේ කාන්තා ලිංගික ශ්‍රමිකයින්ගේ ජාතික ජාලයකි. JMMS ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව, ප්‍රචණ්ඩත්වය, HIV-AIDS වැළැක්වීම සහ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ ගැටළු කෙරෙහි අවධානය යොමු කරයි.

**<u>පිළිගැනීමේ කතාව</u>**
CREA – Global හි විධායක අධ්‍යක්ෂ ගීතාංජලී මිස්රා සමුළුවට සහභාගිවන්නන් පිළිගනු ඇත.

**<u>මේ සමුළුව තියන්නේ ඇයි?</u>**
බංග්ලාදේශය, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල නියෝජිතයින් හතර දෙනෙකු මෙම දකුණු ආසියාවේ රැස්වීම ලිංගික ශ්‍රමිකයින්ට සහ මිත්‍ර පාක්ෂිකයින්ට වැදගත් සහ කාලෝචිත වන හේතුව සම්බන්ධයෙන් ඔවුන්ගේ පැතිකඩ බෙදාහදා ගනු ඇත.

**ජෝයා සික්ඩර්, බංග්ලාදේශය**
සංක්‍රාන්ති ලිංගික සහ විවිධ ලිංගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට ක්‍රියා කරන සංවිධානයක් වන සොම්පූර්නා හි නිර්මාතෘ සහ සභාපති වන අතර බංග්ලාදේශයේ ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ හිටපු සභාපතිදවේ.

**ෂෝවා දන්ගෝල්, නේපාලය**
2007 දී, ඇයගේ නායකත්වය යටතේ, කාන්තා ලිංගික ශ්‍රමිකයින් විසින්, SWAN (නේපාලයේ කාන්තා දැනුවත් කිරීමේ සංගමය) ලෙස හැඳින්වෙන නෙරි වෙතනා සමාජ් ලියාපදිංචි කරන ලදී..

**ෂාසාඩ් පිර්සාඩෝ, පකිස්ථානය**
ආන්තික කණ්ඩායම් සඳහා සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීමට සහ ඔවුන්ට මූලික සෞඛ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමට උපකාර කිරීමට ෂාසාඩ් ප්‍රජා සංවර්ධන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ රජය සමඟ කටයුතු කරයි.

**ඉන්ද්‍රානි කුසුමලතා, ශ්‍රී ලංකාව**
නාගරික නොවන ප්‍රදේශවල ලිංගික ශ්‍රමිකයන් සහ LGBT ප්‍රජාව සමඟ කටයුතු කරන ප්‍රජා මූලික සංවිධානයක් වන ප්‍රජා දිරිය පදනමෙහි ක්‍රියාකාරී සාමාජිකයෙකි.

**ලිංගික ශ්‍රමිකයන්ට සවන් දීම**
මෙම සංවෘත විවෘත මයික් සැසියේදී, බංග්ලාදේශය, ඉන්දියාව, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල ලිංගික ශ්‍රමිකයින් ඔවුන්ගේ බාධාවන් සහ ඔරොත්තු දීමේ කථා බෙදා ගනු ඇත.

*මොඩරේටර්*
**නස්නි, ඉන්දියාව**
ඉන්දියාවේ කාන්තාවන් විසින් මෙහෙයවන යනු ලබන එකම ආචාර ධර්ම වලට අනුකූල සහ ස්වාධීන ග්‍රාමීය ප්‍රවෘත්ති සන්නාමය වන කහබාර් ළහරියාහි ජේෂ්ඨ වාර්තාකරුවේ.

*කථිකයින්:*
**බිෂාකා ලස්කර්, ඉන්දියාව**
බටහිර බෙංගාලයේ පිහිටි ලිංගික ශ්‍රමිකයන්ගේ එකතුවක් වන ඩර්බාර් මහිලා සමන්වයා කමිටුවේ ලේකම්ය.

**ඉස්මත් අරා, බංග්ලාදේශය**
2009 දී රංග්පූර් හි පරෂ් නාරි උන්යන් සංග් නමින් ප්‍රජා මූලික සංවිධානයක් පිහිටුවන ලද අතර ලිංගික ශ්‍රමිකයන් සහ කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සමඟ සමීපව සම්බන්ධ විය.

**කිරන් දේශ්මුක්, ඉන්දියාව**
ලිංගික ශ්‍රමිකයන්ගේ එකතුවක් වන වෙශ්‍යා අන්යාය් මුක්ති පරිශද් (VAMP) හි සාමාජිකයෙන් වේ.

**ලක්ෂ්මි රණභාත්, නේපාලය**
ජග්රිටි මහිලා මහා සන්ග් (JMMS) හි හිටපු ජාතික විධායක අධ්‍යක්ෂක සහ සන්ඩකි පළාතේ, පළාත් ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලය වන සොරෙටො නේපාල් හි නිර්මාතෘ සහ විධායක අධ්‍යක්ෂ ද වේ.

**ලිලී අක්ටර්, බංග්ලාදේශය**
බංග්ලාදේශයේ ලිංගික සේවක ජාලයේ සභාපති සහ බංග්ලාදේශයේ මනික්ගොන්ජ් හි ෂ්වාන්වොර් මෙහිලා සන්ග්ස්තා හි විධායක අධ්‍යක්ෂවේ.

**සුල්තානා බෙගම්, ඉන්දියාව**
ඉන්දියාවේ රාජස්ථානයේ අජ්මීර් හි ලිංගික ශ්‍රමිකයන්ගේ ප්‍රජා මූලික සංවිධානයක් වන සර්වෝදය සමිතියේ ලේකම්ය.

**සකුණි මායාදුන්නේ, ශ්‍රී ලංකාව**
සංක්‍රාන්ති ලිංගික ශ්‍රමිකයන්ගේ සංවිධානයක් වන ට්‍රාන්ස් ඊක්වාලිටි ශ්‍රී ලංකා (සංකාන්ති සමානතා භාරයේ) නිර්මාතෘ සහ අධ්‍යක්ෂවේ.

**තුලාසි ගාන්ධාරි, නේපාලය**
ජග්රිටි මහිලා මහා සන්ග් (JMMS) හි සභාපතිනිය: ඇයගේ ප්‍රජාවේ කාන්තාවන් සවිබල ගැන්වීමට සහ සහාය දැක්වීමට කැප වූ සංවිධානයක් වන එකික්ක්‍රිටි මහිලා සන්ග් පිහිටුවා ගන්නා ලදී.

**එස්, පකිස්ථානය**
ගාසි සමාජ සුබසාධන සංගමය සමඟ වැඩ කරන ප්‍රජා සාමාජිකයෙකි.

**.එෆ්, පකිස්ථානය**
ක්‍රියාකාරී සෞඛ්‍ය සංවිධානය සමඟ වැඩ කරන ප්‍රජා සාමාජිකයෙකි.

**සී, ශ්‍රී ලංකාව**
කාන්තා ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කරන අභිමානී කාන්තා සාමූහිකයේ සභාපතිනියයි

**ක්‍රියා කිරීමට ඇමතීම** : සුනීතා කුජූර්, ඉන්දියාව සහ SWASA
දකුණු ආසියාවේ ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍ර පාක්ෂිකයින් ගෝලීය උද්දේශන සංසදවල පෙනී සිටීම සහ/හෝ තල්ලු කිරීම් වලට එරෙහිව ක්‍රියා කිරීමේ යාන්ත්‍රණයන් සමඟ වැඩ කිරීම වැදගත් වන හේතුව ගැන සුනීතා සහ SWASA හි ලිංගික ශ්‍රමික සාමාජිකාවක් කෙටි දළ විස්තරයක් සහ ගෝලීය උද්දේශන න්‍යාය පත්‍රයට දේශීය පුද්ගලයකුට දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි..

සුනිටා කුජූර් දකුණු ආසියාවේ, නැගෙනහිර අප්‍රිකාවේ, මධ්‍යම ආසියාවේ සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කර ඇති CREA හි උද්දේශන උපදේශකවරියකි.

මැයි 29 වන දින සවස පූර්ණ සැසිය (ප.ව. 6.00 - 7.30)

**බොලිවුඩයේ ලිංගික ශ්‍රමය** : ෂෝහිනි ඝෝෂ් විසින් නිරූපණය කරන ලද කථාවක්
ප්‍රමුඛ පෙළේ තිර රචකයෙකු වන ජාවෙඩ් අක්තාර් බොම්බේ සිනමාව විස්තර කර ඇත්තේ එය ඉන්දියාවේ සමීපතම අසල්වැසියා ලෙසත්, එය "තමන්ගේම සම්ප්‍රදායන්, තමන්ගේම සංකේත, තමන්ගේම ප්‍රකාශණ, ස්වකීය භාෂාවක්" ඇති, එය දන්නා සියල්ලන්ටම වැටහෙන දෙයක් ලෙසයි. මෙම ඉදිරිපත් කිරීම බොම්බේ සිනමාවේ තවායිෆ් සහ ලිංගික ශ්‍රමය පිළිබඳ විචිත්‍රවත් ලෝකය හරහා ගමන් කිරීමකි.

ෂොහිනි ඝ්හොශ් AJK ජන සන්නිවේදන පර්යේෂණ මධ්‍යස්ථානයේ (MCRC) සජ්ජාඩ් සහීර් සභාපති මහාචාර්යවරිය වන අතර නවදිල්ලියේ ජමියා මිල්ලියා ඉස්ලාමියා විශ්ව විද්‍යාලයේ ප්‍රේම්චන්ද් ලේඛනාගාරය සහ සාහිත්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරියද වේ. ඇය කොල්කටාහි ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරය පිළිබඳ වාර්තා චිත්‍රපටයක් වන රාත්‍රී සුරංගනාවන්ගේ කතා, (ටේල්ස් ඔෆ් ද නයිට් ෆෙයරීස් (2002)) හි අධ්‍යක්ෂවරියයි.

මැයි 30 වන දින උදෑසන පූර්ණ සැසිය (පෙ.ව. 11.30 - ප.ව. 1.00)

**නර්තන ප්‍රසංගය :** කොමල් ගාන්ධාර්, ඩර්බාර්, සොනාගච්, ඉන්දියාව
ඩර්බාර් මහිලා සමන්වය කමිටුවේ සංස්කෘතික අංශය වන කොමල් ගාන්ධාර් තුළින් භාෂාමය, ආගමික සහ ප්‍රාදේශීය බාධක මධ්‍යයේ අදහස් හුවමාරු කර ගැනීමට සහ කලාප සහ රටවල් හරහා ලිංගික ශ්‍රමිකයන්ගේ පොදු අනන්‍යතාවයක් ඇති කිරීමට සහ උපදේශන පණිවිඩ පතුරුවා හැරීමට සුවිශේෂී වේදිකාවක් ලෙස මතු විය.

**ලිංගික ශ්‍රමය ඡායාරූපගත කිරීම :** ඉන්දියාවේ ඇනිටා කෙහෙම්කා, ඉන්දියාවේ සබීනා ගාඩිහොකේ සමඟ සංවාදයක්
ඇනිටා කෙහෙම්කා ඡායාරූප ගැනීම ආරම්භ කළේ 1996 දී ය. ඇය සමාජීය වශයෙන් කොන් කරන ලද සහ බැහැර කරන ලද කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ ජීවිත සම්පව අනුගමනය කර ඇත - අතහැර දැමූ වැන්දඹුවන්, බුද්ධිමය ආබාධ සහිත පුද්ගලයින්, ඇබ්බැහිවීම්, HIV සහ AIDS, දේශපාලන සුළුතරයන් සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය. ඇගේ කෘති පුළුල් ලෙස ප්‍රදර්ශනය කර ඇත.

සබීනා ගාඩිහොකේ නවදිල්ලියේ ජමියා මිල්ලියා ඉස්ලාමියා විශ්ව විද්‍යාලයේ හි අන්වර් ජමාල් කිඩ්වායි ජන සන්නිවේදන පර්යේෂණ මධ්‍යස්ථානයේ වීඩියෝ සහ රූපවාහිනී නිෂ්පාදනය පිළිබඳ සහකාර මහාචාර්යවරියකි. ගාඩිහෝක් ස්වාධීන වාර්තා චිත්‍රපට නිෂ්පාදකයෙකු සහ කැමරා ශිල්පියෙකුද වන අතර ඡායාරූප ඉතිහාසඥයෙකු සහ භාරකරුවෙකු ද වේ.

**ක්‍රියා කිරීමට ඇමතීම :** ලිංගික ශ්‍රමිකයින් සහ දකුණු ආසියාවේ මිතුරන් (SWASA)
ප්‍රාදේශීය වේදිකාවේ ලිංගික ශ්‍රමිකයන් සහ දකුණු ආසියාවේ මිතුරන් ගේ (SWASA) සාමාජිකයින් දෙදෙනෙකු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, එහි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ සහ වත්මන් එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු හරහා මතුවන ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්වලට එරෙහි විරෝධය ගැන කතා කරනු ඇත. ඔවුන් 2024 ජූනි මාසයේ පැවැත්වීමට නියමිත මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරය සඳහා සූදානම් වීමේ දී විශේෂ වාර්තාකරුගේ ලිංගික ශ්‍රමය පිළිබඳ හානිකර ආඛ්‍යානවලට එරෙහිව ඔවුන්ගේ සාමූහික උද්දේශනය පිළිබඳ අවබෝධය කෙටියෙන් බෙදා ගනු ඇති අතර, සමුළුවේදී මිත්‍ර පාක්ෂිකයින් සහ ලිංගික ශ්‍රමිකයින්ගෙන් සහයෝගීතාවය සහ ක්‍රියා මාර්ග ගන්නා ලෙෂ ඉල්ලා සිටිනු ඇත.

ලිංගික ශ්‍රමිකයින් සහ දකුණු ආසියාවේ මිතුරන් (SWASA) යනු බංගලාදේශය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාවේ ලිංගික ශ්‍රමිකයින් සහ සහායක ක්‍රියාකාරීන් සහ සංවිධාන අතර සහයෝගී ප්‍රයත්නයකි. මෙම මුලපිරීම LGBTQI සහ කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සහ ආන්තික වූවන්ගේ අනෙකුත් අරගල සමඟ පෙලගැසී ඇති අතර කලාපයේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් කෙරෙහි අවධානය යොමු කරයි.

මැයි 30 වන දින සවස පූර්ණ සැසිය (ප.ව. 4.30 - 7.30)
**චිත්‍රපට ප්‍රදර්ශනය:** පාකිස්තානයේ සර්මඩ් කූසැට්ගේ සින්ඩාගි ටාමාෂා (සර්කස් ඔෆ් ලයිෆ්), සහ සර්මාඩ් කූසාත් සමඟ ෂෝහිනී ඝෝෂ් පසු පැවැත්වූ සංවාදය :

සර්මාඩ් සුල්තාන් කූසාත් අධ්‍යක්ෂකවරයෙක්, නළුවෙක්, නිෂ්පාදකයෙක් සහ තිර රචකයෙකි. සින්ඩාගි ටාමාෂා (2019) ඇකඩමි සම්මාන උළෙලේදී හොඳම ජාත්‍යන්තර චිත්‍රපටය සඳහා පාකිස්තානයේ නියෝජනය ලෙස තේරී පත් විය. කූසාත් චිත්‍රපට සහ අනෙකුත් විෂයයන් ද උගන්වයි.

මැයි 31 වන දින උදෑසන පූර්ණ සැසිය (පෙ.ව. 11.30 - ප.ව. 7.30)

**ශ්‍රී ලංකාවේ ප්‍රජා දිරිය පදනම විසින් ඉදිරිපත් කෙරෙන වේදිකා රංගනය**
ප්‍රජා දිරිය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ ගැටුමේ ඇති වාර්ගික-ආගමික මායිම්වලින් ඔබ්බට යමින් කාන්තා ලිංගික ශ්‍රමිකයන් ඇතුළු ආන්තික ප්‍රජාවන් අතර සාමය සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

**1. මිත්‍රසන්ධාන ගමන : ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍රයින් සමඟ ප්‍රශ්නෝත්තර**
ස්ත්‍රීවාදී මිත්‍රත්වසන්ධානය පිළිබඳ ලිංගික ශ්‍රමික ක්‍රියාකාරීන් සහ මිතුරන් සමඟ ඔවුන්ගේ සිතුවිලි, ප්‍රායෝගිකව පෙනෙන්නේ කෙසේද සහ ඔවුන්ගේ ව්‍යාපාර මත පදනම් වූ පැන නැගී ඇති අභියෝග පිළිබඳව අන්තර්ක්‍රියාකාරී සාකච්ඡාවක්.

*මොඩරේටර්:*
ගීතාංජලී මිස්රා

*පැනලිස්ට්/විද්වත් මණ්ඩලය*
**ආවා, නේපාලය**
ලිංගික ශ්‍රමිකයන් ප්‍රමුඛ සංවිධානයක් වන සංගාර්ෂා මහිලා සමුහා, භක්තාපූර් හි සභාපතිනියයි: කාන්තා ලිංගික ශ්‍රමිකයන්ගේ ජාතික ජාලයේ (JMMS) සම්බන්ධීකාරක ද වේ.

**බිෂාකා දත්ත, ඉන්දියාව**
චිත්‍රපට නිෂ්පාදක, ක්‍රියාකාරිකයෙක් සහ හිටපු මාධ්‍යවේදියෙක් : මුම්බායි හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය සහ කාන්තා අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ වැඩ කරන ලාභ නොලබන ආයතනයක් වන පොයිඉන්ට් ඔෆ් විව් හි සම-නිර්මාතෘ සහ විධායක අධ්‍යක්ෂද වේ.

**මහ්බුබා අක්තර් මහ්මුඩ්, බංග්ලාදේශය**
බංග්ලාදේශයේ ප්‍රමුඛ කාන්තා ක්‍රියාකාරී සංවිධානයක් වන නරිපොක්ඛො හි නිර්මාතෘ සාමාජිකාවකි.

**නූර් ෆුර්කාන්, පකිස්ථානය**
2019 දී විද්‍යාලයේ සිටියදී, පාකිස්තානය පුරා ශාඛා සහිත ස්ත්‍රීවාදී සාමූහිකයක් වන අඋරට් මාර්ච් සංවිධානය කරන ලදී: අඩු ආදායම්ලාභී ව්‍යාපාරික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කැප වූ සංවිධානයක් වන සර්කල් විමෙන් හි සේවය කරයි.

**පුතුල් සිං, ඉන්දියාව**
ඉන්දියාවේ බටහිර බෙංගාලයේ ලිංගික ශ්‍රමිකයෙකු නායකත්වය දෙන ප්‍රජා මූල සංවිධානයක් වන ඩූර්බර් මහිලා සමන්වය කමිටුවේ සාමාජිකාවක් හා සමස්ත ඉන්දීය ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ (AINSW) මූලික කමිටු සාමාජිකයෙකි.

**රොෂාන් ද සිල්වා, ශ්‍රී ලංකාව**
DAST හි විධායක අධ්‍යක්ෂ වන අතර අභිමානි කාන්තා සාමූහිකය සහ සංක්‍රාන්ති සමානාත්මතා භාරය (TET) යන දෙකම හැඩගැස්වීමට උපකාර කර ඇති අතර රෙඩ් අම්බ්රෙල්ලා ජාලය (කාන්තා ලිංගික ශ්‍රමිකයින් සමග), HIV/TB CSO ජාලය සහ CARE Consortium (LGBT ප්‍රජාව සමඟ) ලෙස ශ්‍රී ලංකාවේ සංසද තුනක් ස්ථාපිත කරන ලදී.

**ස්ත්‍රීවාදී මිත්‍රසන්ධාන : ප්‍රතිපත්ති සහ භාවිතයන්**

*කථිකයින්:*
ශ්‍රිලතා බට්ලිවල, ඉන්දියාව
2008 සිට 2022 දක්වා විහිදෙන CREA ලිංගික ශ්‍රමික මිත්‍රත්වය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් මත පදනම්ව, ශ්‍රීලතා "ස්ත්‍රීවාදී මිත්‍රසන්ධානය - ප්‍රතිපත්ති සහ භාවිතයන්" නමින් ප්‍රකාශනයක් ලියා ඇත. වීඩියෝ පටිගත කිරීමක් හරහා, ඇය මෙම තේමාව මත ලිවීමට හේතු, සිද්ධි අධ්‍යයන ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය සහ ස්ත්‍රීවාදී සන්ධාන ආරම්භ කිරීම සහ ගොඩනැගීම, ස්ත්‍රීවාදී සන්ධාන පවත්වා ගැනීම සහ ආතතීන් සහ අභියෝග හැසිරවීම පිළිබඳ ප්‍රධාන ඉගෙනුම් කිහිපයක් මෙවර බෙදා ගනී.

ශ්‍රිලතා බටිලිවල, ස්ත්‍රීවාදී ක්‍රියාකාරිනියක්-විශාරදවරියක් සහ පුහුණු කරන්නියක් වන අතර දැනට CREA හි දැනුම ගොඩනැගීමේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරියකි. ඇයගේ අධ්‍යයනය සහ අවධානය යොමු කරන්නේ ප්‍රායෝගිකව දැනුම ගොඩනැගීමයි.

**<u>ස්ත්‍රීවාදී මිත්‍රසන්ධානය - ප්‍රතිපත්ති සහ භාවිතයන් ප්‍රකාශනය එළිදැක්වීම</u>**
ලිංගික ශ්‍රමික ක්‍රියාකාරීන් සමුළුවේදී නිල වශයෙන් ප්‍රකාශනය දියත් කරනු ඇත.

<u>මැයි 31 වන දින සවස පූර්ණ සැසිය (ප.ව. 6.00 - 7.30)</u>

**<u>නේපාලයේ ශිල්පී රඟහල විසින් සංවිධානය කරන ලද ලිංගික ශ්‍රමිකයන් විසින් මෙහෙයවන ලද ප්‍රසංගය</u>**

ශිල්පී රඟහල විසින් රංගන ශිල්පීන් හඳුන්වා දෙන අතර දින තුන පුරාවට සහභාගීත්ව වැඩමුළුවේ ඔවුන්ගෙන් කෙටි අදහසක් බෙදා ගනී.

ශිල්පී රඟහල 2006 දී පිහිටුවන ලද්දේ නේපාලයේ සමාජ-දේශපාලන පරිවර්තනයට දායක වීමේ දැක්ම ඇතිවය. ඔවුන් ප්‍රාදේශීය ප්‍රජාවන්හි රඟපා ඇත, දේශීය නාට්‍ය කණ්ඩායම් සංවර්ධනය කර විවිධ නාට්‍ය ඉසව් පවත්වා ඇත.

**<u>ක්‍රියාකාරී ප්‍රතිඵලය</u>** <u>-පූජා බද්‍රිනාත්, ලිංගික අයිතිවාසිකම් මුලපිරීම සහ SWASA</u>
පූජා සහ SWASA හි සාමාජිකයින් දෙදෙනෙකු උද්දේශන වැඩමුළු වලින් අදහස් සහ SWASA ගම්මානය, සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ජුනි සැසියේදී ඉදිරිපත් කිරීම සඳහා කෙටුම්පත් ප්‍රකාශයකට දායක වන ලිංගික ශ්‍රමිකයන්ගේ පණිවිඩ ගැන අදහසක් බෙදා ගනු ඇත. ඒ වගේම අත්සන් කීයක් අවශ්‍යද කියා සහ සහභාගිවන්නන් නිරතව සිටීම සඳහා (ඔවුන් කැමති නම්).පසු විපරම ගැනද කරුණු බෙදා ගැනේ.

පූජා යනු මානව හිමිකම් කවුන්සිලයේ සහ ලිංගික අයිතිවාසිකම් මුලපිරීමේ ජ්‍යෙෂ්ඨ උද්දේශක උපදේශකයෙකි, ලිංගික අයිතිවාසිකම් මුලපිරීම යනු කැනඩාව, ඉන්දියාව, ඊජිප්තුව, ආර්ජන්ටිනාව පදනම් කරගත් ජාතික සහ කලාපීය සංවිධානවල සන්ධානයක් වන අතර එය එක්සත් ජාතීන්ගේ ලිංගිකත්වයට අදාළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට එක්ව කටයුතු කරයි.

ලිංගික ශ්‍රමිකයින් සහ දකුණු ආසියාවේ මිතුරන් (SWASA) යනු බංගලාදේශය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාවේ ලිංගික ශ්‍රමිකයින් සහ සහායක ක්‍රියාකාරීන් සහ සංවිධාන අතර සහයෝගී ප්‍රයත්නයකි. මෙම මුලපිරීම LGBTQI සහ කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සහ ආන්තික වූවන්ගේ අනෙකුත් අරගල සමඟ පෙලගැසී ඇති අතර කලාපයේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් කෙරෙහි අවධානය යොමු කරයි.

**<u>CREA විසින් අවසන් කිරීම/සමාප්තිය</u>**

## වැඩමුළු

**වැඩමුළුවක් යනු කුමක්ද?** සරලම දෙය නම්, වැඩමුළුවක් යනු කිසියම් ගැටලුවක් හෝ මාතෘකාවක් සමීපව පරීක්ෂා කර ක්‍රියාවට ගත යුතු මාර්ග හඳුනා ගැනීමට පුද්ගලයින් කණ්ඩායමක් රැස්වීමකි. වටමේසයකට ප්‍රතිවිරුද්ධව, වැඩමුළුවක් නිරූපනය කරන ත්‍රීව ඉගෙනීම නිසා සාකච්ඡාවට භාජනය වන ගැටළු විසඳීම සඳහා සංයුක්ත, ප්‍රායෝගික ක්‍රම ජණනය කර ගැනීමට උපකාරී වේ.

සමුලුවේදී, විශේෂිත තේමාවක් මත ගිලී ඉගෙනීම සහ ඵලදායී සාකච්ඡා සඳහා මගපෙන්වන වැඩමුළු තුනක් ලබා දෙනු ඇත. තුනම එකවර ක්‍රියාත්මක වන අතර, 1 වන දින මෙන්ම 3 වන දින ද පිරිනැමෙනු ඇත, එවිට සහභාගිවන්නන්ට ඔවුන්ගේ රුචිකත්වයට අනුව දෙකකට සහභාගී විය හැකිය.

<u>**සහායක පිළිවෙත් : ලිංගික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ මිතුරන්**</u>

**මෙය කුමක් ගැනද:** ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ව්‍යාපාර සහ ඔවුන්ගේ මිතුරන් අතර ඇති සමීප සබඳතා, සහයෝගීතා භාවිතයන් රාශියකට මඟ පෑදී ඇත (සංවිධානයක් මිත්‍රයෙකුට ලබා දෙන ප්‍රායෝගික මග පෙන්වීම සහ උපකාරය සඳහා භාවිතා කරන යෙදුම). බොහෝ විට මෙය තරඟකාරී වන අතර, බලය සහ සම්පත් අසමතුලිතතාවයන් හඳුනා ගන්නා සහයෝගීතාවයේ වඩාත් චේතනාන්විත භාවිතයන් නිර්මාණය කිරීමට ඔවුන්ට උදව් වී ඇත. මෙම සහභාගීත්ව වැඩමුළුව කලාපයේ සහභාගිවන්නන්ගේ දැනුම හා අත්දැකීම් උපයෝගී කරගනිමින් වඩාත් අර්ථවත් සහකාර භාවිතයන් ප්‍රකාශ කිරීමට සහ හැඩගැස්වීමට අවස්ථා නිර්මාණය කරනු ඇත.

**අපේක්ෂා කළ යුතු දේ:** වැඩමුළුව ලිංගික ශ්‍රමිකයින්ගේ අත්දැකීම් මත පදනම් වූ සහකාර භාවිතයන් පරාසයක් හඳුනාගැනීම සඳහා දෘශ්‍ය සිතියම්කරණ අභ්‍යාසයකින් ආරම්භ වේ. ධනාත්මක සහ සෘණාත්මක අත්දැකීම් දෙකම කරලියට ගෙන ඒම සඳහා කුඩා කණ්ඩායම් සාකච්ඡා පවත්වනු ඇත. ධනාත්මක පරිචයන් හැඩගැස්වීම සඳහා ප්‍රධාන ප්‍රතිපත්ති සහ ප්‍රවේශයන් සැකසීම සඳහා මාර්ගෝපදේශක ක්‍රියාවලියක් අනුගමනය කරමින් භූමිකාව රඟ දැක්වීම සහ අනෙකුත් නිර්මාණාත්මක මෙවලම් ද භාවිතා කරනු ඇත.

පූරක : සොලිඩැරිටි ෆවුන්ඩේෂන් ඉන්දියා (සහයෝගිතා පදනම, ඉන්දියාව): ආයතනික ශක්තිමත් කිරීම, නායකත්වය ගොඩනැගීම, ජීවනෝපාය සහ යහපැවැත්මේ මුලපිරීම් හරහා ලිංගික ශ්‍රමිකයින්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික සුළුතරයන්ට මෙම සංවිධානය සහාය වේ. ( https://www.solidarityfoundation.in/)

*ස්ථානය:* බනියන් ශාලාව

**ආරක්ෂිතව සිටීම: අන්තර්ජාලය හරහා ලිංගික ශ්‍රමිකයින් සඳහා අයිතිවාසිකම් සහ ආරක්ෂාව**

*එය කුමක් ගැනද:* විශේෂයෙන්ම දකුණු ආසියානු සන්දර්භය තුළ - අද්විතීය සමාජ, දේශපාලන, නෛතික සහ ආරක්ෂිත බාධාවන් හමුවේ තාක්ෂණය ලිංගික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා සපුරාලන ආකාරය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැත. ලිංගික ශ්‍රමිකයින් සහ මිතුරන් සමඟ මෙම සම-ඉගෙනුම් වැඩමුළුව ලිංගික ශ්‍රමිකයන්ගේ ජීවිතවල තාක්ෂණයේ මංසන්ධියක් මෙන්ම එය ඔවුන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි වඩා හොඳින් සැලසුම් කළ හැකි ආකාරය ගවේෂණය කරයි.

*අපේක්ෂා කළ යුතු දේ:* වැඩමුළුව ආරම්භ වන්නේ ලිංගික ශ්‍රමිකයින් ඩිජිටල් ලෝකය සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය, ඔවුන්ට එහි තිබෙන ප්‍රයෝජනය සහ ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳ ගැටලු සහභාගීත්වය හරහා සොයා බැලීමෙනි.

ඩිජිටල් අයිතිවාසිකම් සහ නෛතික/නියාමන රාමු පිළිබඳ කෙටි සාකච්ඡාවකින් පසුව, පූරක විසින් ඩිජිටල් ආරක්ෂාව සඳහා උපාය මාර්ග බෙදා ගනී. ලිංගික ශ්‍රමිකයින් තම අවශ්‍යතා සහ ආශාවන් ආමන්ත්‍රණය කරන අන්තර්ජාලයේ සුදුසු වේදිකාවක්/අවකාශයක් කෙබඳු විය හැකිදැයි සාමූහිකව සිතන ප්‍රතිපත්ති ප්‍රකාශන ලිවීමේ අභ්‍යාසයකින් වැඩමුළුව අවසන් වේ.

පූරක :ඩිජිටල් ෆියුචර්ස් ලැබ්, ඉන්දියාව, ගෝලීය දකුණේ තාක්ෂණය සහ සමාජය අතර සංකීර්ණ අන්තර්ක්‍රියා පරීක්ෂා කරන බහුවිධ පර්යේෂණ ජාලයකි. සාක්ෂි මත පදනම් වූ පර්යේෂණ, සහභාගීත්ව දූරදර්ශීභාවය සහ මහජන සහභාගීත්වය හරහා, ඔවුන් සාධාරණ, ආරක්ෂිත සහ සැලකිලිමත් අනාගතයක් කරා යන මාවත් හඳුනා ගනී. (https://digitalfutureslab.in/)

*ස්ථානය:* ශිවපුරි ශාලාව

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ හානිකර අදහස්වලට එරෙහිව කටයුතු කිරීම: ප්‍රායෝගික මෙවලමක්**

*මෙය කුමක්ද:* එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 56 වැනි සැසිවාරය 2024 ජුනි 18 සිට ජූලි 12 දක්වා පැවැත්වීමට නියමිතය. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරු රීම් අල්සලම් විසින් "ගණිකා වෘත්තිය සහ කාන්තාවන්ට එරෙහි හිංසනය සහ ගැහැණු ළමයින්" පිළිබඳ සිය වාර්තාව මෙම සැසියේදී ඉදිරිපත් කරනු ඇත. එය ඇයගේ පෙර ප්‍රකාශ, සමාජ මාධ්‍ය වල ප්‍රකාශ සහ වාර්තාව දැනුම් දීම සඳහා කැඳවා ඇති කලාපීය උපදේශනවලදී කල ප්‍රකාශ සහ සාකච්ඡා මත පදනම්ව ගත් කල ලිංගික ශ්‍රමයට විරෝධී වාර්තාවක් යැයි බොහෝ දෙනා විශ්වාස කරයි..

අනෙකුත් විශේෂ ක්‍රියා පටිපාටිවල ඇති උනන්දුව උත්තේජනය කිරීම ඇතුළුව, විවිධ මට්ටම්වල ආඛ්‍යානවලට එරෙහිව ක්‍රමෝපායන් පිළිබඳ සාකච්ඡාවක් සඳහා මෙය භාවිතා කරනු ඇත. වඩාත් නිශ්චිතව, මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේදී ප්‍රකාශයක් කෙටුම්පත් කළ හැකි ආකාරය සහ එම සීමිත ඉඩ ප්‍රයෝජනයට ගනිමින් ප්‍රධාන උත්සුකයන් සහ එම ප්‍රකාශය කිරීමේ ඇති විය හැකි වටිනාකම ඉස්මතු කරන්නේ කෙසේද යන්න මෙම වැඩමුළුව මගින් ඉස්මතු කරනු ඇත.

*අපේක්ෂා කළ යුතු දේ:* සහභාගිවන්නන්ට UN SR-VAW සමඟ සම්බන්ධ වීම ගැන විස්තරාත්මකව සාකච්ඡා කිරීමට හැකි වනු ඇත: ඇගේ වාර්තාව, බලපෑම, ජාතික මට්ටමින් සිදුවිය හැකි හානි, සහ සාමූහිකව ඇගේ උපදේශනයට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසියේදී සහ ඉන් පසුව පවා පෙනී සිටීම සඳහා භාවිතා කළ හැකි ප්‍රධාන පණිවිඩ සහිත කෙටුම්පත් දළ සටහනක් සැකසීම මෙම වැඩමුළුවේ අරමුණයි.

පූරක/ඇන්කර්: ලිංගික අයිතිවාසිකම් මුලපිරීම, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලිංගිකත්වයට අදාළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට එක්ව ක්‍රියා කරන කැනඩා, ඉන්දියාව, ඊජිප්තුව, ආර්ජන්ටිනාව යන රටවල ජාතික සහ කලාපීය සංවිධානවල සන්ධානයකි. (https://www.sexualrightsinitiative.org/)

*ස්ථානය:* කයිලාෂ් ශාලාව

## වට මේස සාකච්ඡා

*වට මේසයක් යනු කුමක්ද?* වටමේසයක් යනු විශේෂිත තේමාවක් මත කණ්ඩායමක් සමඟ මෙහෙයවන සංවාදයකි - සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ, ඔව්, ධූරාවලි නොවන වට මේසයක් වටා ය. ඊනිව් වටමේස සඳහා තේමාවන් මතුවූයේ කලාපයේ ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍රයින් සමඟ කල විස්තීර්ණ සාකච්ඡා වලිනි. මෙම සංවාදවලට සංකල්පමය සහ අත්දැකීම් සහිත දැනුම සහ තොරතුරු ඇතුළත් වන අතර, සියලුම සහභාගිවන්නන්ට හරස් ඉගෙනීම සඳහා අවස්ථාවක් ලබා දේ. තෝරාගත් සහභාගිවන්නන් සංවාදය ආරම්භ කිරීමට උපකාර කරනු ඇත.

**වටමේස 1: අවිධිමත් වැඩ පිළිබඳ පුළුල්, පුළුල් ලෝකය**

අවිධිමත් අංශයේ සේවය කරන කාන්තාවන් බහුවිධ පාවෙන සේවක අනන්‍යතා - ඇඟලුම් සේවිකාවන්, ඉදිකිරීම් කම්කරුවන්, කර්මාන්තශාලා සේවකයන්, ලිංගික සේවිකාවන්...යනාදියයි, නමුත් ලිංගික ගණුදෙණු වල යෙදෙන අවිධිමත් අංශයේ සියලුම කාන්තාවන් ලිංගික ශ්‍රමිකයන් ලෙස හඳුනා නොගනී. ලිංගික ශ්‍රමිකයන් පිළිබඳ ඒකාකෘතිවලට අභියෝග කරන සැසියකදී මෙය ගවේෂණය කරනු ඇත. එය විශාල අවිධිමත් ආර්ථිකයක කොටසක් ලෙස සහ කාන්තාවන් සඳහා ජීවනෝපාය විකල්ප කිහිපයෙන් එකක් ලෙස ලිංගික රැකියාව ස්ථානගත කිරීමට ද උපකාරී වනු ඇත.

*ස්ථානය:* කයිලාෂ් ශාලාව

පහසුකම් සපයන්නා:

**අශිලා දන්දෙණිය, ශ්‍රී ලංකාව**

ශ්‍රී ලංකාවේ ඉහළ-පහළ සහ පුරුෂ මූලික වෘත්තීය සමිති ව්‍යාපාරවලට විකල්පයක් ලෙස කාන්තාවන් ප්‍රමුඛ 'Stand-Up' කම්කරු ව්‍යාපාරය ආරම්භ කළ හිටපු කර්මාන්තශාලා සේවකයෙකි.

*කථිකයින්:*

**මීරා රාඝවේන්ද්‍ර, ඉන්දියාව**

ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් සහ තෙලන්ගානා හි ලිංගික ශ්‍රමිකයින් ප්‍රමුඛ ප්‍රජා පාදක සංවිධාන ජාලයක් වන *Me and My World* (මම සහ මගේ ලෝකය) සඳහා සහය දක්වන Women's Initiatives (WINS) හි නිර්මාතෘද වේ..

**කේ රත්නකුමාරි, ඉන්දියාව**

ආන්ද්‍රා ප්‍රදේශ් හි ලිංගික ශ්‍රමිකයන් විසින් මෙහෙයවන ප්‍රජා පාදක සංවිධානයක් වන ධරනි හි සභාපති, මම සහ මගේ ලෝකය ජාලයේ කොටසක් සහ ලිංගික ශ්‍රමිකයන්ගේ ජාතික ජාලයේ (NNSW) සාමාජිකයෙකි.

**බිමල මල්ලා තකුරි, නේපාලය**

ලිංගික ශ්‍රමික ක්‍රියාකාරිකයෙකු, මහිලා සහයෝගී සමූහයේ නිර්මාතෘ සහ ලිංගික ශ්‍රමිකයින් ප්‍රමුඛ සංවිධාන 33ක ආවරන සංවිධානයක් වන ජග්රිටි මහිලා මහා සංඝයේ හිටපු සභාපතිනියයි.

**බබිතා බරල්, නේපාලය**

නේපාලයේ ලිංගික ශ්‍රමිකයන් සමඟ ශක්තිමත් මිත්‍රත්වයක් ඇති, වැඩ කිරීමේ අයිතිය කෙරෙහි අවධානය යොමු කරන ස්ත්‍රීවාදී සංවිධානයක් වන ටරන්ගිනි හි සම්බන්ධීකාරක.

**චමිලා තුෂාරි, ශ්‍රී ලංකාව**

ශ්‍රී ලංකාවේ කාන්තා සේවිකාවන් සාමූහික කිරීම තුළින් නිදහස් වෙළඳ කලාපයේ කාන්තා සේවක අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරන දාබින්ඩු (Dabindu)සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකාවවේ.

**ශ්‍රීජානා පුන්, නේපාලය**

නේපාලයේ කාන්තාවන් සඳහා වන කාන්තා සංසදයේ (WOFOWON) නිර්මාතෘ, නේපාලයේ විනෝදාස්වාද අංශයේ සේවය කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට ක්‍රියා කරන පළමු රාජ්‍ය නොවන සංවිධානයයි.

**වටමේස 2: පුනරුත්ථාපනය නොව අයිතිවාසිකම්**

වැඩිහිටි, ස්වේච්ඡා සහ සම්මුතියෙන් ලිංගික සේවයේ යෙදෙන කාන්තාවන් බොහෝ විට වින්දිතයින් හෝ අපරාධකරුවන් ලෙස ලේබල් කර ඇති අතර සාමාන්‍යයෙන් දරුණු අයිතිවාසිකම් කඩවීම්වලට මුහුණ දෙයි. පොලිසිය විසින් වටලා රැඳවුම් නිවාසවලට යවන ලදුව, මෙම පුනරුත්ථාපනය ඔවුන් මතට බලෙන් යොමු කෙරේ. සමහර රටවල, ලිංගික ශ්‍රමිකයින් වීම අපරාධයක් ලෙස සලකනු නොලබන අතර, ඔවුන්ගේ කාර්යයේ විවිධ අංශවල දඬුවම් ලැබිය හැකි වැරදි තිබේ. (ගණිකා මඩමක් පවත්වාගෙන යාම සහ/හෝ ලිංගික වැඩ සඳහා කුලියට දීම හෝ පෙළඹවීම). මෙම සැසියේ මේසය මත මෙම ගැටළු මෙන්ම ඒවාට අභියෝග කිරීමට ලිංගික ශ්‍රමිකයින් සහ හිතවතුන් විසින් යොදවන උපාය මාර්ග ද ඇත.

*ස්ථානය:* කස්තාමණ්ඩප් ශාලාව

*පහසුකම් සපයන්නා:*
**ෆාරුක් ෆයිසල්, බංග්ලාදේශය**
බංග්ලාදේශයේ කාන්තා අයිතිවාසිකම් සහ මානව හිමිකම් සංවිධානවල සන්ධානයක් වන ෂොන්ඝොටි හි විධායක කමිටු සාමාජිකයෙකි වන නීති ආධාර සහ මානව හිමිකම් සංවිධානයක් වන අයින් ඔ සලිශ් කෙන්ඩ්‍රා හි විධායක අධ්‍යක්ෂක.

*කථිකයින්:*
**ඉන්ද්‍රානි කුසුමලතා, ශ්‍රී ලංකාව**

**ෆරීඩා පර්වීන්, බංග්ලාදේශය**
බංග්ලාදේශයේ ෆරිද්පූර් සහ රාජ්බාරි හි ගණිකා මඩම්වලින් ලිංගික ශ්‍රමිකයින් බලහත්කාරයෙන් ඉවත් කිරීමට විරෝධය පළ කරමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ බංග්ලාදේශයේ ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ SWNOB සාමාජික.

**ගීතා දේවි පෝඩෙල්, නේපාලය**
දිස්ත්‍රික්ක 25 ක ප්‍රජා පාදක කාන්තා ලිංගික ශ්‍රමිකයින් විසින් මෙහෙයවන සංවිධාන 33 කින් සමන්විත ජාතික ලිංගික ශ්‍රමිකයන් විසින් මෙහෙයවන ජාලයක් වන ජග්රිටි මහිල මහ සින්ඝ් (JMMS)හි සම ලේකම් සහ (JMMS) හි අනුබද්ධිත මහිලා ෂාසාක්ටිකරන් හි ලේකම්.

**සී, ශ්‍රී ලංකාව**

**රොෂාන් ද සිල්වා, ශ්‍රී ලංකාව**

**කිරන් දේශ්මුක්, ඉන්දියාව**

**වටමේස 3: නව කාමර, නව ගතිකත්වය: සබැඳි ලෝකයක ලිංගික ශ්‍රමය**

ලිංගික ශ්‍රමය වැනි අවිනිශ්චිත, සාපරාධී වැඩවල යෙදී සිටින පුද්ගලයින් තාක්ෂණය (ජංගම දුරකථන) සහ සබැඳි අවකාශයන් (සමාජ මාධ්‍ය) උත්තේජනය කරන්නේ කෙසේද? සාම්ප්‍රදායික සොලිසිටේෂන් / පෙළඹවීමේ ආකාර පරිවර්තනය වෙමින් පවතී. මෙම පරිවර්තනයත් සමඟම, ලිංගික ශ්‍රමිකයන් විසින්ම ඔවුන්ගේ අනන්‍යතා - සේවා සපයන්නන්, අන්තර්ගත නිර්මාපකයින් සහ ව්‍යවසායකයින් ලෙස - නැවත සකස් කරති. මෙම වෙනස්වන ගතිකත්වයන් ලිංගික ශ්‍රමිකයින්ගේ ජීවිත සහ යහපැවැත්ම සඳහා පමණක් නොව ලිංගික ශ්‍රමිකයින් සමඟ මැදිහත්වීම් සංකල්පනය කර ක්‍රියාත්මක කරන ආකාරය කෙරෙහි ද බලපෑම් ඇති කරයි.

*ස්ථානය:* නාලන්දා ශාලාව
පහසුකම් සපයන්නා:
බිෂාකා දත්ත, ඉන්දියාව

චිත්‍රපට නිෂ්පාදකයෙක්, ක්‍රියාකාරිකයෙකු සහ හිටපු මාධ්‍යවේදියෙකු මෙන්ම ඉන්දියාවේ පෙයින්ට් ඔෆ් විව් හි සම-නිර්මාතෘ සහ විධායක අධ්‍යක්ෂ.

*කථිකයින්:*

**නිබෙඩිතා සර්කාර්, බංග්ලාදේශය**

බංග්ලාදේශයේ BRAC විශ්වවිද්‍යාලයේ ජේම්ස් පී ග්‍රාන්ට් මහජන සෞඛ්‍ය පාසලෙහි සහකාර පර්යේෂණ සම්බන්ධීකාරක, සහ කාන්තා ලිංගික ශ්‍රමිකයන් සමඟ BRAC ප්‍රමුඛ පර්යේෂණවලට සහභාගී වී ඇත.

**කුසුම්, ඉන්දියාව**

ලිංගික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ දරුවන්ගේ සමාජ හිමිකම් සඳහා අයිතීන් ඉදිරියට ගෙන යන අසාද් ටිට්ලියන් සාමූහිකය සඳහා නායකත්වය දෙයි. කලින් ලිංගික ශ්‍රමිකයන්ගේ සමස්ත ඉන්දීය ජාලයට අනුබද්ධව සහ ජාලයේ හිටපු සභාපති.

**වනමාලි කෞෂල්‍යා ගලප්පත්ති, ශ්‍රී ලංකාව**

කාන්තා සහ මාධ්‍ය සාමූහිකය සමඟ සම්බන්ධ වී, අනන්‍යතාවය, අන්තර්කරණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු සම්බන්ධව වැඩ කරයි: මීට පෙර අන්තර් වාර්ගික යුක්තිය සහ සමානාත්මතාවය සඳහා වූ ව්‍යාපාරය (MIRJE) සමඟ වැඩ කර ඇත.

**නුපූර් අෆ්රීන්, බංග්ලාදේශය**

පාර සහ නිවස පදනම් වූ ලිංගික ශ්‍රමිකයෙක්: බංගලාදේශයේ ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ සාමාජිකයෙකු මෙන්ම බංග්ලාදේශයේ ඩකා හි ෂෝනෝ නාරි ෂොන්හො සංගමයේ සාමාජිකයෙකු.

**මිෂාරි වීරබංසා, ශ්‍රී ලංකාව**

කුයීර් (Queer) ෆෙමිනිස්ට්, දැනට මකන්න කිසිවක් නැත (ඩිලීට් නතිං) වැඩසටහන් සම-නායක ලෙස සේවය කරයි.

**වටමේස 4: නීතිය සහ සමාජ ව්‍යාපාර : උපකාර ලබා ගැනීම**

**විස්තරය:** ඉන්දියාවේ සහ බංගලාදේශයේ නීතිඥයින්, රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයින් සහ ලිංගික ශ්‍රමික ක්‍රියාකාරීන් විවිධ සන්දර්භයන් තුළ නීතිමය සහ ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම සහ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි ඇති බලපෑම පිළිබඳ අත්දැකීම් බෙදා ගනු ඇත. සහභාගිවන්නන් ඔවුන්ගේ අනුශාසනා සහ ව්‍යාපාර ගොඩනැගීමේදී නීතියේ කේන්ද්‍රීයභාවය ප්‍රශ්න කිරීමට සහ දකුණු ආසියාව පුරා විවිධ අත්දැකීම් වලින් ඉගෙන ගැනීමට දිරිමත් කරනු ලැබේ. ලිංගික ශ්‍රමිකයින් අධිකරණ ශාලාවෙන් පිටත නඩු විභාග කරගැනීමට සලකා බලා ඇත්ද සහ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියේද යන්න සාකච්ඡා කිරීමට ද මෙම සාකච්ඡාව අවකාශය සලසනු ඇත.

ස්ථානය: බන්යන් හෝල්

*පහසුකම් සපයන්නා:*

**ට්‍රිප්ති ටැන්ඩන්, ඉන්දියාව**

ඉන්දියාවේ පැරණිතම මානව හිමිකම් සංවිධානයක් වන නීතිඥ සාමූහිකයේ නවදිල්ලියේ නීතිඥයෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ.

*කථිකයින්:*

**රාමා දෙබ්නාත්, ඉන්දියාව**

බාසිර්හට් ඩුර්බර් සමිටි හි ඉලක්කගත මැදිහත්වීම් වැඩසටහන සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ: ඩර්බාර් මහිලා සමන්වය කමිටුවේ සභාපති ලෙස කටයුතු කර ඇත.

**සිප්‍රා ගෝස්වාමි, බංග්ලාදේශය**

බංග්ලාදේශ නීති ආධාර සහ සේවා භාරයේ ෆරීඩ්පූර් ඒකකය සමඟ කටයුතු කරන නීතිඥයෙක්.

**ජෝයා සික්ඩර්, බංග්ලාදේශය**

**රචනා මුද්‍රබෝයිනා, ඉන්දියාව**
ට්‍රාන්සවිෂන් හි නිර්මාතෘ, සංක්‍රාන්ති ලිංගික ගැටළු සඳහා ඉන්දියාවේ පළමු යූටියුබ් නාලිකාව, මෙන්ම තෙලන්ගානා හිජ්රා අන්තර් ලිංගික සංක්‍රාන්ති ලිංගික සමිතියේ ආරම්භක සාමාජිකයෙකි: දැනට සංක්‍රාන්ති ලිංගික සායනයක සංක්‍රාන්ති සෞඛ්‍ය විශේෂඥයෙකු ලෙස සේවය කරයි.

**භාරතී ඩේ, ඉන්දියාව**
දකුණු ආසියාවේ විශාලතම ලිංගික ශ්‍රමිකයන් නායකත්වය දෙන මූල්‍ය ආයතනයක් මෙහෙයවූ සහ පළමු වන ඌෂා සමුපකාරයේ සාමාජිකාව: සමස්ත ඉන්දීය ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ (AINSW) ප්‍රධාන කමිටු සාමාජික: ලිංගික ශ්‍රමිකයින් මුහුණ දෙන නීතිමය ගැටලු විභාග කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය පත් කළ මණ්ඩලයේ සේවය කර ඇත.

**වටමේස 5: ජාවාරමට එරෙහි වීම: දැන් කතාව කුමක්ද?**

පුද්ගලයන් ලිංගික කාර්යයේ යෙදෙන්නේ වර්ණාවලියක් ඔස්සේ වැටෙන හේතු මතයි - එනම් තේරීම, වටපිටාව සහ බලහත්කාරකම්. ජාවාරම්-විරෝධී අපරාධ නීති යනු ලිංගික ශ්‍රමයට පුද්ගලයින් බල කිරීම මැඩලීමේ උපාය මාර්ගයයි. කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිකයින්ට කාන්තා අයිතිවාසිකම් පිළිගැනීම සහ/හෝ ගණුදෙනු මත ලිංගික හැසිරීම් වල යෙදීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ගැටුම්කාරී ප්‍රති-සම්බන්ධතාවයක් ඇත. බොහෝ විට ප්‍රචණ්ඩත්වයේ භාෂාවෙන් සයනය කරන ලද මෙය, ලිංගික සේවයේ යෙදී සිටින සියලුම කාන්තාවන් වින්දිතයන් සහ සූරාකෑමට යටත්වන ආඛ්‍යානයක් හැඩගැස්වීමට උපකාරී වී ඇත. මේ සමඟ අත්වැල් බැඳගෙන ඇත්තේ, ලිංගික වැඩ සහ ජාවාරම් සමඟ පටලවා ගන්නා ආඛ්‍යානයක් තල්ලු කරන ඉතා බලගතු ජාවාරම්-විරෝධී කර්මාන්තයක් බිහිවීමයි. මෙම වාද විවාද සහ වැරදි ලේබා ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරයේ අරගලවල කේන්ද්‍රස්ථානය වී ඇත.

ස්ථානය: ශිවපුරි ශාලාව

පහසුකම් සපයන්නා:
**මෝනා මිශ්‍රා, ඉන්දියාව**
1995 දී, ඇය සහ ඇගේ නැසීගිය සැමියා ඉන්දියාවේ HIV ආසාදිතයන් සමඟ ජීවත් වන සහ පීඩාවට පත් වූ පුද්ගලයින්ගේ පළමු උපකාරක කණ්ඩායම ආරම්භ කළහ. ඉන්දියාවේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරයේ දිගුකාලීන සගයෙකි.

කථිකයින්:

**හසීබ් රතෝර්, පකිස්ථානය**
ලාහෝර් හි HOPE (හෝප්)[1] සමඟ සම්බන්ධයි - මානව හිමිකම් වෙනුවෙන් දැඩි ලෙස පෙනී සිටින ඔවුන්ගේ කාර්යය ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික සුළුතරයන් සඳහා ඇතුළත් කිරීම් සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම වටා කැරකෙයි.

**ෂෝවා දන්ගෝල්, නේපාලය**

**ජහනර කහටුන්, බංග්ලාදේශය**
නරිපොක්කො ගේ මැදිහත්වීම සමඟ සම්බන්ධ වී, බංග්ලාදේශයේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරය ශක්තිමත් කිරීමට කටයුතු කරයි.

**භාග්‍ය ලක්ෂ්මි, ඉන්දියාව**
ඉන්දියාවේ කර්නාටකා හි ලිංගික ශ්‍රමිකයින් 6,000කට වැඩි පිරිසකගේ සංගමයක් වන අශෝදය සමිතියේ සාමාජික: සමස්ත ඉන්දීය ලිංගික ශ්‍රමිකයන්ගේ ජාලයේ (AINSW) ප්‍රධාන කමිටු සාමාජික.

---

[1] හෝප් - ලාහෝර්හි ධනාත්මක අපේක්ෂාවක් පමණක් ඇත - HOPE - Have Only Positive Expectation

ස්වසා **SWASA**

දකුණු ආසියාවේ ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍ර පාක්ෂිකයින් හෙවත් ස්වසා යනු බංගලාදේශය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාවේ ලිංගික ශ්‍රමිකයින් සහ සහායක ක්‍රියාකාරීන් සහ සංවිධාන අතර සහයෝගී ප්‍රයත්නයකි. මෙම මුලපිරීම LGBTQI සහ කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සහ ආන්තික වූවන්ගේ අනෙකුත් අරගල සමඟ පෙලගැසී ඇති අතර කලාපයේ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් කෙරෙහි අවධානය යොමු කරයි.

## අවකාශයන්

**ඡායාරූප ස්ටුඩියෝව**
ඇනිටා කෙහෙම්ක විසින්
ඡායාරූප ශිල්පියාගේ සටහන: "ලිංගික ශ්‍රමිකයින් පිළිබඳ මගේ කලින් ලියකියවිලි ලිංගික කාර්යය සූරාකෑමේ කර්මාන්තයක් ලෙස දැකීමේ ප්‍රතිචාරයක් විය. එය ඔවුන්ගේ සෞඛ්‍ය හා ශාරීරික ආරක්ෂාව, ආර්ථික සූරාකෑම සහ ඔවුන්ගේ සාමාන්‍ය ජීවන සහ සේවා කොන්දේසි සම්බන්ධ ගැටළු පිළිබඳව සොයා බැලීය. කැමැත්ත ව්‍යංග වූ අතර අභිප්‍රාය වූයේ ඔවුන්ට ගෞරවය ලබා දීම සහ එකල ප්‍රමුඛ බැල්ම වූ වොයියුරිසම් වළක්වා ගැනීමයි.

ෆොටෝ ස්ටුඩියෝව සමඟ, ප්‍රතිමූර්තිය සෑදීමේ ප්‍රවේශය සහයෝගීතාවයෙන් යුක්ත වනු ඇත. සෑම වාඩිවන කෙනෙකු සඳහාම, අභිප්‍රාය වනුයේ එම මොහොතේ ශක්තිය, සමබරතාවය සහ අභිලාෂය සොයා ගැනීම සහ ලිංගික කාර්යය මගින් නිර්වචනය කර ඇති ඔවුන්ගේ පෞරුෂයෙන් ඔබ්බට බැලීමයි. එහි ප්‍රතිඵලය වනුයේ වේදිකාගත වූ ප්‍රතිමූර්තියක් වන අතර එක් එක් පුද්ගලයා තමාගේම රංගනය මෙහෙයවයි."

*ස්ථානය:* රථගාල අසල

**ඡායාරූප කුටිය**
අනෙක් පැත්තේ සිටීම ගැන දැනෙන්නේ කුමක්ද? පොලිස් නිලධාරියාගේ බැටන් පොල්ල අතට ගැනීම මොන වගේ හැඟීමක්ද? විනිසුරුවරයාගේ කබාය පැළඳීම ගැන දැනෙන්නේ කුමක්ද? ඔබේම අතේ බලය අල්ලාගෙන සිටීමේ හැඟීම කුමක්ද? එන්න සොයා බලන්න!

අපගේ ඡායාරූප කුටිය ඔබට අධිකාරියේ කබාය පැළඳීමට, ඔබේ හදවතේ කැමැත්ත අනුව පෙනී සිටීමට සහ මෙම අද්විතීය භූමිකාව ආපසු හැරවීම පිළිබඳ ඡායාරූප සාක්ෂි නිවසට ගෙන යාමට ආරාධනා කරයි. අපගේ ඡායාරූප ශිල්පියා ඔබ කැමති භූමිකාවට තබා ටික වේලාවකට පසුව ඔබට ඡායාරූපය ලබා දෙනු ඇත.

*ස්ථානය: ගැසෙබෝ*

**ස්වසා ගම්මානය**

දකුණු ආසියාවේ ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍ර පාක්ෂිකයින් හෙවත් ස්වසා යනු ලිංගික ශ්‍රමිකයන්ගේ කලාපීය ජාලයකි. ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සහ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතියට සහාය දක්වන ප්‍රගතිශීලී ව්‍යාපාරවලින් ලිංගික සේවා සහ ක්‍රියාකාරීන් සැපයීම.

ස්වසා ගම්මානය යනු ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන දකුණු ආසියාතික බිම් මට්ටමේ ක්‍රියාකාරීන්ට එකිනෙකා හමුවීමට, කතා කිරීමට සහ කල්පවත්නා සම්බන්ධතා ඇති කර ගැනීමට හැකි අවකාශයකි. වෙනත් රටවල සහභාගිවන්නන්ට සංචාරය කිරීමට, ඉගෙනීමට සහ ඔවුන්ගේම අත්දැකීම් බෙදාහදා ගැනීමට හැකි වන පරිදි හවුල්කරුවන්ට එකිනෙකා සමඟ කතා කිරීමට සහ අන්තර් ක්‍රියා කිරීමට හැකි ගතික අවකාශයක් වනු ඇත. සමුළුවට සහභාගි වන දකුණු ආසියා කලාපය පුරා සිටින හවුල්කරුවන්ට පැනල් සාකච්ඡා, ප්‍රදර්ශන, නිදර්ශන, කතාන්දර ආදිය සංවිධානය කිරීමට අවකාශය භාවිතා කිරීමට නිදහස ඇත. දකුණු ආසියාවේ හවුල්කරුවන් විසින් අවකාශය සැලසුම් කරනු ඇත.

ස්වසා ගම්මානය ඇඩ්ඩා සෑම දිනකම විවිධ තේමාවන් ඇත:
දිනය 1: ඉදිරිපත් කිරීමේ ගංගාව (ප.ව. 2.30 - ප.ව. 4.30)
දිනය 2: ලිංගික වැඩ විශ්ව විද්‍යාලය (ප.ව. 2.30 - ප.ව. 4.00)
දින 3: ව්‍යාපාරයන් හරහා (ප.ව. 2:30 - ප.ව. 4.30)

සමුළුවේ සෑම දිනකම මුළු දවසම මැන්ඩි (වෙළඳපොළ) සහ ගම්මාන ජ්ලාසා ද ඇත.

*ස්ථානය:* ඇර්බොරෙටුම් ගාර්ඩන්

**<u>ආර්ට් + ඇක්ටිවිස්ම් = ආර්ටිවිස්ම්</u>**

කලාව අපව සතුටු කරයි, බාධා කරයි, අපව සම්බන්ධ කරයි, අපව චලනය කරයි. ක්‍රියාකාරීත්වය සමාජ වෙනසක් ඇති කිරීම සඳහා මනෝභාවයන් වෙනස් කිරීමට උත්සාහ කරයි. මේ දෙක හිතාමතාම, සිහිබුද්ධියෙන්, ප්‍රායෝගිකව මිශ්‍ර කරන්න, ඔබට ප්‍රබල උත්ප්‍රේරක මෙවලමක් ඇත - එය හඳුන්වන්නේ කලාක්‍රියාකාරීත්වය ලෙසයි. ලිංගික ශ්‍රමිකයින් මෙම යෙදුම ආරම්භ කිරීමට බොහෝ කලකට පෙර එය කරමින් සිටියා! ඔවුන් මහජන මතයට බලපෑම් කිරීමට සහ ඔවුන්ගේ අනන්‍යතාවය සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන් තමන්ගේම ආඛ්‍යානය හැඩගස්වා ගැනීමට කලාත්මක හා සංස්කෘතික මාධ්‍ය පරාසයක් භාවිතා කළහ.
එම රැඩිකල් ප්‍රකාශනය සමරමින්, කලාක්‍රියාකාරීත්වය අවකාශය මුල් ලිංගික ශ්‍රමිකයන් විසින් මෙහෙයවන කලාක්‍රියාකාරීත්වය ප්‍රදර්ශනය කරයි. එය ප්‍රජා සාමාජිකයින්ට සහ හිතවතුන්ට එම වැඩ කොටසට දායක වීමට ද ඉදිරිපත් කරයි - සහභාගිවන්නන්ට ලබා ගත හැකි ද්‍රව්‍ය සමඟ තමන්ගේම චිත්‍ර, පෝස්ටර් හෝ ලාංඡන නිර්මාණය කළ හැකිය. මෙහි ඇති කලාත්මක බව සමුළුවේ වෙනත් අවකාශයන් වෙත ප්‍රදර්ශනය කිරීමට සහ කාවැද්දීමට හැකි වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු - එබැවින් ඔබේ කලා කටයුතු සම්බන්ධ කර, එය අන් අය සමඟ බෙදා ගැනීමට හෝ සමාජ මාධ්‍ය ඔස්සේ බෙදා හැරීමට සැසියකට ගෙන ගොස් ඡායාරූප ගත කිරීමට ඡායාරූප කුටිය වෙත ගෙන යන්න. .

*පරිපූරක:* අම්රා පඩාටික්, බටහිර බෙංගාල ඉන්දියාවේ සහ CREA හි ලිංගික ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ ස්වයං-නායකත්වය ලබන සංවිධානයකි

*ස්ථානය:* බයිතක්

**මතකය තුළ**

අපි ජීවත් වන්නේ ලිංගික ශ්‍රමිකයන්ට, ඔවුන්ගේ අයිතිවාසිකම්වලට, ඔවුන්ගේ ජීවනෝපායවලට, ඔවුන්ගේ අභිමානයට දැඩි විරෝධයක් දක්වන මොහොතකයි. නමුත් මෙම රැස්වීම අපගේ හවුල් ආරක්ෂිත අවකාශයයි - රැස්ව සිටින අය නොසලකා ඉදිරියට තල්ලු කරයි. අපි එසේ කරන්නේ සාමූහිකත්වයේ පරිවර්තනීය ආකෘතීන් සහ හවුල් නායකත්වයෙන් මෙහෙයවනු ලබන විශිෂ්ට ව්‍යාපාරයක් නිර්මාණය කළ දකුණු ආසියාවේ ලිංගික ශ්‍රමිකයන්ගේ කැපකිරීම් සහ ධෛර්යය මත ගොඩනැගීමෙනි.

මෙම අවකාශය අපට අහිමි වූ සියලුම සුවිශේෂී පුද්ගලයින්ගේ දායකත්වයට ගෞරව කර සමරයි. විශේෂයෙන් දරුණු වසංගතයක් තුළ දැඩි සේවා සපයන්නන් ලෙස රැඳී සිටි පුද්ගලයින්, එම වසංගතයේ විනාශකාරී ප්‍රතිවිපාක බොහෝ දෙනෙකුට වඩා සෘජුව විඳගත් පුද්ගලයින් මෙන්ම මහජනයාගේ ඇසට නොපෙනී සිටියත් වැඩ කළ මිනිසුන් අපි ප්‍රශංසාවෙන් සහ කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරයි

මෙම අසාමාන්‍ය පුද්ගලයින්ට ඔබේ ගෞරව දැක්වීමට කරුණාකර මෙම අවකාශය භාවිතා කරන්න. මිතුරන්ගේ හෝ සගයන්ගේ නම් එකතු කරන්න, ඔවුන්ගේ ඡායාරූප බෙදා ගන්න, ඔබේ පණිවිඩ ලියන්න. නැතිනම් ඔබේ මතකයන් සමඟ මොහොතක් මෙහි ගත කරන්න.

*ස්ථානය:* ඩර්බාර් මළුව

**සාද සහ විනෝදය!**

**මැයි 29: බොලිවුඩ් රාත්‍රිය (ප.ව. 9.00 සිට)**
ඔබේ ප්‍රිතිමත් ඇදුම් සහ අඩි උස පාවහන් පැළඳ නර්තනය, සංගීතය සහ ප්‍රිතිමත් රාත්‍රියක් සඳහා අප හා එක්වන්න! DJ සමඟ බෙදා ගැනීමට කරුණාකර ඔබේ ප්‍රියතම ගීත රැගෙන එන්න.

**මැයි 30: විලාසිතා දැක්ම (ප.ව. 9.30 සිට)**

මෙම සංදර්ශනය විලාසිතා සහ විනෝදාස්වාදයේ ආකර්ෂණීය රාත්‍රියක් වනු ඇත, අප සියලු දෙනා විසින් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා පෙළපාලියක්.. එය සිත් ඇදගන්නාසුළු කටයුත්තක් වනු ඇතැයි අපි පොරොන්දු වෙමු, අප සෑම කෙනෙකුටම අපගේ ප්‍රදර්ශනය සඳහා අවස්ථාවක් ඇත. ඔබගේ ඇළුම් පැළඳුම් සහ දේවල් රැගෙන එන්න, නවයට සැරසී එන්න, නැතහොත් ඔබ සිටින ආකාරයටම එන්න - හරි යැයි හැඟෙන ඕනෑම දෙයක් සහ ඔබට. මිතුරන් සමඟ හෝ තනිවම වේදිකාව මත ඇවිදින්න - හොඳ යැයි හැඟෙන ඕනෑම දෙයක්.- ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතීන් වෙනුවෙන් ඇවිදීමට අපි සැවොම එක් වෙමු!

අපි ඔබට ලියාපදිංචි වීමට, ඔබේ වේදිකාවේ නම බෙදා ගැනීමට සහ ඒ සමඟ එන ඕනෑම පණිවිඩයක් සංවිධායක වෙත යැවීමට ලියාපදිංචි පත්‍රයක් බෙදා ගන්නෙමු. කරුණාකර සුෂ්මා ලුත්‍රා (CREA) හට සංගීත අවශ්‍යතා ගැන දන්වන්න.

**මැයි 31: සංගීත සහ නර්තන රාත්‍රිය (ප.ව. 9.00 සිට)**
සංගීතයේ සහ නර්තනයේ බලය තුළින් අපව ප්‍රබෝධමත් කර ගැනීමට සමුළුවේ අවසාන දිනයේ අප හා එක්වන්න! සංගීත යෝජනා බෙහෙවින් දිරිමත් කෙරේ!